**කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන වසර**

**2016/2017 අධ්‍යයන වර්ෂය - දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය**

**(2019 ජනවාරි)**

**ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණය**

SRMG 32032: **ක්‍රීඩා සහ විශ්‍රාන්තිය සඳහා මූල්‍ය ගණකාධිකරණය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**(ගණක යන්ත්‍ර භාවිතයට අවස්ථාව ලබා දෙනු ලැබේ)**

**ප්‍රශ්න සංඛ්‍යාව : 06 යි.** **කාලය : පැය 02යි.**

01. (i) ගිණුම් ලෙජරයක අඩංගුවන්නා වූ ගිණුම්වර්ග කොටස් පහ සඳහන් කරන්න.

(ලකුණු 05)

(ii) ගිණුම්කරණ ඒකකයක් තුළ මූලික වශයෙන් පවතින මූල්‍ය ප්‍රකාශන නම් කරමින් ගිණුම්කරණ ඒකකයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

02. (i) ශේෂ පත්‍රයක් තුළ අඩංගුවන්නා වූ ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 05)

(ii) මූල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන ප්‍රධාන තීරණ දෙවර්ගය පිළිබඳව අවධානය යොමු කරමින් ක්‍රීඩා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා මූල්‍ය කළමනාකරණය හා ගණකාධිකරණයේ ඇති වැදගත්කම කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

03. i) දළ කාරක ප්‍රාග්ධනය හා ශුද්ධ කාරක ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) සුදුසු මූල්‍ය සම්පාදන මාර්ගයන් තෝරා ගැනීමේදී සැලකිල්ලට ගත යුතු සාධක පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10)

04. (i) අය-වැය ලේඛණයක් සකස් කිරීමේ මූලික අදියර හතර සඳහන් කරන්න.

(ලකුණු 05)

(ii) අය-වැය ලේඛනයක් ක්‍රියාත්මක කිරීම හරහා ලබා ගත හැකි ප්‍රයෝජන ක්‍රීඩා කළමනාකරුවෙකු ලෙස එම ක්ෂේත්‍රයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

05. විලියම් ද සොයිසා මහතා තමා විසින් ඉතිරි කරන ලද රු. 400,000.00 ක මුදල යොදවා Neyon නමින් ක්‍රීඩා භාණ්ඩ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එහිදී තම මිතුරාගෙන් රු. 1,000,000.00 වටිනාකමකින් යුතු භාණ්ඩ තොගයක් ණයට ගත් අතර, වෙළඳසැල ආරම්භ කිරීම සඳහා රු. 200,000.00ක මුදලක් යොදා ගොඩනැගිල්ලක් මිලට ගන්නා ලදි.

ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා රු. 1,500,000.00 බැංකු මුදලක් ලබා ගත් අතර ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා රු. 75,000.00 මුදලක් වැය විය. වෙළඳසැල් උපාංග නවීකරණය සඳහා රු. 50,000.00 මුදලක් වැය වේ යැයි ගණන් බලා ඇත. මෙම ගණුදෙනුව ඇසුරින් වත්කම් වගකීම් හා හිමිකම් පිළිබඳ විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

06. විනෝද උද්‍යානයක් පවත්වාගෙන යාම සඳහා ආයෝජකයෙකු රු.200,000.00ක වරණීය කොටසක් මිලදී ගැනීමට කටයුතු කරන අතර සෑම වසරක් අවසානයේම රු. 40,000.00ක ලාභාංශයක් හිමිවන අතර වසර 03ට පසුව ආයෝජනය කළ මුදලද නැවත ලබා දෙනු ලැබේ. මෙයට අදාළව සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයේ පිරිවැය හා වරණීය කොටස් ප්‍රාග්ධනයේ පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 20)